# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1838/56 - 2013 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2013.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උපවගන්තියේ 'උ' ජේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා '(ආනුෂංගික විධිවිධාන)' පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

***කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

01. මෙම අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2012 අංක 01 කුලී රථ නවතා තැබීම පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් අනුමතකර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණු ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකි ය.

1A - PG 001855 — 100 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 02 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට වාර්ෂිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථවාහන නවතා තැබීම කළයුතු අතර, එම කුලී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තුව ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේ ය.

04. පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පලවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත. උපලේඛන අංක 01 අනුව නව නැවතුම් ස්ථානයක් ඇති කිරීමේදී මහ සභා යෝජනා ස්ථිරත්වයෙන් ලබාගත යුතුයි.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබාගැනීම සඳහා තුන්වැනි උපලේඛනයේ ප්‍රකාර පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම් කළ යුතු ය.

07. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බල පත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම අවුරුද්දකම ජනවාරි මස 31 වැනි දිනට පෙර අදාළ අවුරුද්ද සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථ වාහන නවතා තැබීමේ නැවතුම් පොළකට ඇතුළ් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම්පොළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ වාර්ෂික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලීරථ වාහන, නැවතුම්පොළ තුළ දී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙක් කුලීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වන සේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ / හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නිත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කෙරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛන අංක 01*

01. අම්පිටිය, තලාතුඔය මාර්ගයේ තලාතුඔය බස් නැවතුම ඉදිරිපිට දකුණු පස දිගින් අඩි 100 ක්.
02. තලාතුඔය ගුරුදෙනිය මාර්ගයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට තලාතුඔය නගරය දෙසට දික් අඩි 75 ක්.
03. තලාතුඔය මාරස්සන මාර්ගයේ තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය ඉදිරිපිට වම්පස දිගින් අඩි 150 ක්.
04. කඳාකුල බෝධිය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ සිට පින්නගොල්ල මාර්ගයේ දිගින් අඩි 75 ක්.
05. තලාතුඔය මාරස්සන මාර්ගයේ මුදුනකඩේ හන්දිය ප්‍රාදේශීය සභා උප කාර්යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට ඉදිරියට දිගින් අඩි 50 ක්.
06. තලාතුඔය මාරස්සන මාර්ගයේ බව්ලාන මාර්ගය ආරම්භක හන්දියේ දකුණු පස දිගින් අඩි 50 ක්.
07. තලාතුඔය කන්දහන්දිය මාර්ගයේ රජමාවත සන්ධිවන කිවුල්ළිඳ හන්දිය දකුණු පස දිගින් අඩි 75 ක්.
08. තලාතුඔය මාරස්සන මාර්ගයේ වෙලේගම්මැද්ද හන්දිය දකුණු පස දිගින් අඩි 50 ක්.
09. මාරස්සන ප්‍රධාන මාර්ගයේ සිට කන්දේවෙල මාර්ගය ආරම්භක හන්දියේ වම්පස දිගින් අඩි 60 ක්.
10. මාරස්සන අම්බලම ඉදිරිපිට දිගින් අඩි 50 ක්.
11. මාරස්සන පස්ගම හන්දිය ඉදිරිපිට දිගින් අඩි 50 ක්.
12. මාරස්සන පස්ගම මාර්ගයේ වම්පස හේවාවිස්ස ගොන්නගහමුල ක්‍රීඩාගාරය ඉදිරිපිට දිගින් අඩි 60 ක්.
13. මාරස්සන පස්ගම මාර්ගයේ වම්පස බව්ලාන හන්දියේ සිට මාරස්සන දෙසට දිගින් අඩි 60 ක්.
14. පස්ගම හන්දිය නාථ දේවාලයට ප්‍රවිශ්ඨ මාර්ගයේ සිට මාරස්සන දෙසට දිගින් අඩි 75 ක්.
15. මාරස්සන නගරයේ ගොවිජන කේන්ද්‍රයට ප්‍රවිශ්ඨ මාර්ගයේ සිට ඉදිරිපිට දිගින් අඩි 100 ක්
16. මාරස්සන කොළඹිස්ස මාර්ගයේ කන්දහන්දිය මොරගහමුල හන්දිය දකුණු පස දිගින් අඩි 75 ක්.
17. කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ උඩුදෙනිය මුස්ලිම් විද්‍යාලයට ප්‍රවිෂ්ඨ හන්දියේ දකුණු පස දිගින් අඩි 30 ක්.
18. කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ වම්පස දෙහල්කඩ හන්දියේ සිට ඉදිරියට දිගින් අඩි 50 ක්.
19. දෙහල්කඩ කහඹිලියාව මාර්ගය ආරම්භයේ සිට වම්පස දිගින් අඩි 60 ක්.
20. කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ පොත්ගොඩ හන්දිය වම්පස විශාකා වෙළඳ සැල ඉදිරිපිට දිගින් අඩි 75 ක්.
21. කන්දහන්දිය කොළඹිස්ස මාර්ගය නීලවල හන්දිය වම්පස දිගින් අඩි 50 ක්.
22. කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ මුරපොල හන්දිය දකුණු පස දිගින් අඩි 100 ක්.
23. කොළඹිස්ස හන්දියේ බස්නැවතුම ඉදිරිපිට දිගින් අඩි 75 ක්.
24. කොළඹිස්ස දෙල්තොට මාර්ගයේ එනසල්ගොල්ල විද්‍යාල හන්දිය වම්පස දිගින් අඩි 100 ක්.
25. උඩුදෙනිය බෝපිටිය හන්දිය ඉදිරිපිට දිගින් අඩි 100 ක්.
26. උඩුදෙනිය ප්‍රධාන මාර්ගයේ සිට දෙහල්කඩ මාර්ගයට හැරෙන හන්දියේ සිට ඉදිරියට දෙහල්කඩ දෙසට දිගින් අඩි 30 ක්.
27. මයිලපිටිය ගල්ලිඳ හන්දිය පැරණි මාර්ගයේ පාලම අසළ සිට නගරය දෙසට දිගින් අඩි 150 ක්.
28. මයිලපිටිය මහා විද්‍යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට නගරය දෙසට දිගින් අඩි 50 ක්.
29. මයිලපිටිය කිවුලතැන්න හන්දියේ සිට බස් නැවතුම දක්වා දිගින් අඩි 50 ක්.
30. මයිලපිටිය හඟුරන්කෙත මාර්ගයේ අඹවත්ත මාර්ගය ආරම්භක ස්ථානයේ සිට ඉදිරියට දිගින් අඩි 30 ක්.
31. කන්දහන්දිය අධිකාරිගම හන්දියේ වටරවුම සැතපුම් පුවරුවේ සිට හඟුරන්කෙත දෙසට දිගින් අඩි 100 ක්.
32. කන්දහන්දිය අධිකාරිගම මාර්ගයේ දකුණු පස පල්ලේ මා ඔය පාලමේ සිට කන්දහන්දිය දෙසට දිගින් අඩි 60 ක්.
33. හඟුරන්කෙත ප්‍රධාන මාර්ගයේ සිට කන්දහන්දිය මාරස්සන මාර්ගය ආරම්භයේ වම්පස දිගින් අඩි 150 ක්.
34. කන්දහන්දිය හඟුරන්කෙත මාර්ගයේ වම්පස මාඔය පාලම සිට කන්දහන්දිය දෙසට දිගින් අඩි 30 ක්.
35. කන්දහන්දිය හඟුරන්කෙත මාර්ගයේ වම්පස උනුවින්න කනත්ත අසළ බස් නැවතුම ඉදිරිපිට දිගින් අඩි 50 ක්.

*උපලේඛන අංක 01 (සම්බන්ධිතයි)*

36. බව්ලාන බස් නැවතුම ඉදිරිපිට දිගින් අඩි 50 ක්.
37. තලාතුඔය මොරගොල්ල මාර්ගයේ අංකෙළිපිටිය හන්දිය වම්පස මඩිත්ත මාර්ගය ආරම්භයේ සිට තලාතුඔය දෙසට දිගින් අඩි 75 ක්.
38. තලාතුඔය මොරගොල්ල මාර්ගයේ මහවංගුව බුදුපිළිමය අසළ සිට ඉදිරිපිට දිගින් අඩි 60 ක්.
39. තලාතුඔය මොරගොල්ල මාර්ගයේ මොරගොල්ල හන්දිය වම්පස බෝක්කුවේ සිට ඉදිරියට දිගින් අඩි 120 ක්.
40. මොරගොල්ල බෙල්වුඩ් හන්දිය කිරිමැටිය අතුරු මාර්ගය ආරම්භයේ සිට ගලහ දෙසට දිගින් අඩි 100 ක්.
41. මහනුවර ගලහ ප්‍රධාන මාර්ගයේ වම්පස බෙල්වුඩ් මාර්ගය ආරම්භයේ සිට ගලහ දෙසට දිගින් අඩි 30 ක්.
42. මහනුවර ගලහ මාර්ගයේ දකුණු පස ගලහ අන්නාසිවත්ත මාර්ගයේ සිට ප්‍රාදේශීය සභා පුස්තකාලය ඉදිරිපිට දිගින් අඩි 50 ක්.
43. ගලහ පුපුරුස්ස පාර.
44. ගලහ ප්‍රධාන වීදියේ ආරේකරේ මාර්ගයේ ආරම්භයේ සිට දෙල්තොට දෙසට දිගින් අඩි 150 ක්.
45. ගලහ දෙල්තොට මාර්ගයේ වම්පස ලංකා බැංකුව ඉදිරිපිට දිගින් අඩි 40 ක්.
46. දෙල්තොට හේවාහැට පාර ගබඩාගම හන්දියේ සිට නගරය දෙසට සිට දිගින් අඩි 50 ක්.
47. දෙල්තොට ගලහ මාර්ගයේ හේවාහැට හන්දියේ සිට නගරය දෙසට වම්පස දිගින් අඩි 75 ක්.
48. දෙල්තොට ප්‍රධාන විදියේ ප්‍රාදේශීය සභා පොදු වෙළඳපල භූමියට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට කරගස්කඩ විද්‍යාලය දෙසට දිගින් අඩි 100 ක්.
49. දෙල්තොට බෝපිටිය මාර්ගයේ කරගස්කඩ විද්‍යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට නගරය දෙසට දිගින් අඩි 75 ක්.
50. වතුලියද්ද වැවේ කඩේ පාර ආරම්භක හන්දියේ ගාල්තැන්න දෙසට දකුණු පස අඩි 50 ක්.
51. ගාල්තැන්න පාර බෝගහලන්ද හන්දියෙන් වම් පස අඩි 50 ක්.
52. මොනරංගල රෝහල ඉදිරිපිට නැවතුම්පොල.
53. ගාල්තැන්න පාර තලපිටිය හන්දිය වම් පස අඩි 50 ක්.
54. ගාල්තැන්න ගොවි සෙවන ඉදිරිපිට ප්‍රාදේශීය සභා මාවතෙන් දකුණු පස අඩි 50 ක්.
55. ගාල්තැන්න මාර්ගයේ ලුණුවැල්ල හන්දිය වම්පස අඩි 100 ක්.
56. රටේමුල්ල ග්‍රාමීය බැංකු ඉදිරිපිට දකුණු පස අඩි 50 ක්.
57. වැල්දඹල හන්දිය ඇතුල්ගම දෙසට වම් පස අඩි 100 ක්.
58. පුලියද්ද හන්දියේ සිට ඇතුල්ගම දෙසට වම් පස අඩි 100 ක්.
59. කොටබෝගල හන්දියේ සිට රටේමුල්ල දෙසට වම් පස අඩි 150 ක්.
60. ඇතුල්ගම මහ කඩේ ඉදිරිපිට රටේමුල්ල දෙසට වම් පස අඩි 50 ක්.
61. එලමල්දෙනිය හන්දියේ සිට පනන්වල දෙසට අඩි 50 ක්.
62. පනන්වල හන්දියේ සිට අංකෙලිපිටිය දෙසට අඩි 100 ක්.
63. නැහිනිවෙල පාලම අසල සිට මහනුවර දෙසට මී. 50 ක්.

*උපලේඛන අංක 02*

| | | |
|---|---|---|
| 01 | ත්‍රීරෝද රථයක් සඳහා | රු. 150.00 මසකට |
| 02 | මෝටර් රථයක් සඳහා | රු. 300.00 මසකට |
| 03 | වෑන් රථයක් සඳහා | රු. 300.00 මසකට |
| 04 | ලොරි රථයක් සඳහා | රු. 500.00 මසකට |
| 05 | බස් රථයක් සඳහා | රු. 500.00 මසකට |
| 06 | වෙනත් බර වාහනයක් සඳහා | රු. 550.00 මසකට |

*උපලේඛන අංක 03*

**බලපත්‍ර සඳහා අයදුම්පත**

1. වාහනයේ අංක සහ වර්ගය : ...........................................................
2. අයිතිකරුගේ නම, හැඳුනුම්පත් අංකය : ...........................................................
3. ලිපිනය : ...........................................................
4. රියදුරුගේ නම : ...........................................................
5. රියදුරුගේ හැඳුනුම්පත් අංකය : ...........................................................
6. රියදුරු බලපත්‍ර අංකය : ...........................................................
7. ලිපිනය : ...........................................................
8. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය : ...........................................................
9. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යක් සඳහා ද? : ...........................................................
10. එහි ධාරිතාව - ප්‍රමාණය : ...........................................................

ඉහත තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

...........................................................,
අයදුම්කරුගේ / රියදුරුගේ අත්සන.

දිනය : ...........................................................,

ආදායම් පරීක්ෂක වාර්තාව

01. නැවතුම් පොළ පිළිබඳ විස්තර :
02. බලපත්‍ර ගාස්තුව :

........................................................... වර්ෂයට බලපත්‍ර ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

...........................................................
ආදායම් පරීක්ෂක.

සභාපතිතුමාගේ නිර්දේශය

ඉහත වාර්තාව අනුව බලපත්‍ර ලබාදීම අනුමත කරමි/නොකරමි.

...........................................................,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

12 - 614/1

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උපවගන්තියේ 'ඌ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා '(ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2012 අංක 03 පීඩාකාරී ව්‍යාපාර/අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලැබේ.

2. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, උපලේඛනවල දැක්වෙන පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යාම නොකළ යුතුය.

3. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක් ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බලපැවැත්විය යුතු ය.

4. ව්‍යාපාරයේ පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම් එම ගොඩනැගිල්ල, පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොලබන්නේ ය.

(අ) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල්වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපාරදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(ඇ) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2ට වැඩි උසකින් තිබිය යුතුය.

(ඈ) වහළය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඉ) දැව කර්මාන්ත සියල්ල තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතුය.

(ඊ) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් තනවා තිබිය යුතුය.

(උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

5. සෑම බලපත්‍රධාරියකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

6. බලපත්‍රධාරියකු විසින් පීඩා ඇති වීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවතක් ඔස්සේ රැගෙන යාමේදී, කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

7. සෑම බලපත්‍රධාරියකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ ඝණීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

8. සෑම බලපත්‍රධාරියකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර ඒවා දිනපතා සේදීම කළ යුතුය.

9. සෑම බලපත්‍රධාරියකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

10. සෑම බලපත්‍රධාරියකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

11. සෑම බලපත්‍රධාරියකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

12. සෑම බලපත්‍රධාරියකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා ප්‍රාදේශීය සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියකුම, හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියකුම, යම් ගංගාවක්, දියපාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ යම් කාණුවක්, හෝ යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

15. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් රාජකාරි වේලාවන් තුළදී, පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යනු ලබන පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය, තවද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

16. බලපත්‍ර පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

17. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමාවෙත ලැබී දින 30ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

18. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතු ය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතු ය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරනය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

20. මෙම ආඥාපනතේ 164 වගන්තිය යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ කර්මාන්ත හෝ ව්‍යාපාර කිහිපයක් එකම ස්ථානයක පවත්වාගෙන යන්නා වූ අවස්ථාවක ඒ එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ පාවිච්චි කරන නැතහොත් වෙන්කර ඇති භූමි වර්ග ප්‍රමාණය අනුව බලපත්‍ර ගාස්තු වෙන් වශයෙන් අයකළ යුතුය.

21. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩලයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ (2) වැනි උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ බලපත්‍රධාරියා යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපල ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

"සභාව" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයෙක්" යන්නෙන් සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*පළමුවැනි උපලේඛනය*

*පීඩාකාරී ව්‍යාපාර*

1 පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
2 සම් පදම් කිරීම.
3 සම් විකිණීම.
4 සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා).
5 ඡායාරූප ශාලාවක් පැවැත්වීම.
6 පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම.
7 විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම.
8 කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම.
9 පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබාගැනීම.
10 දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
11 සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම.
12 පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13 සබන් නිෂ්පාදනය කිරීම.
14 සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.
15 අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම.
16 ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
17 ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම.
18 වේවැල් භාණ්ඩ නිපදවීම.
19 වඩුකර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
20 සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම.
21 රසකැවිලි වර්ග නිපදවීම.
22 පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම).
23 බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර).

*පළමුවැනි උපලේඛනය (සම්බන්ධිතයි)*

24 දත් බුරුසු නිපදවීම.
25 රා එකතු කිරීම.
26 විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම.
27 යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම.
28 පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
29 සෝඩා නිපදවීම.
30 සම් භාණ්ඩ නිපදවීම.
31 පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම.
32 මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම.
33 ඉටිපන්දම් නිපදවීම.
34 කපුරු නිපදවීම.
35 ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
36 රෙදි සෝදන නිල් නිපදවීම.
37 ලාකඩ නිපදවීම.
38 සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම.
39 පාසැල් රටහුණු නිපදවීම.
40 ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
41 ටයර් නැවත පිරවීම.
42 ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
43 සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
44 සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් - සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
45 ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
46 යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
47 පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.
48 යන්ත්‍රාණුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම.
49 ධාන්‍ය හෝ මාෂභෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

*දෙවැනි උපලේඛනය*

*අන්තරාදායක ව්‍යාපාර*

1 තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
2 මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම.
3 මුද්‍රණාලයක් පැවැත්වීම.
4 කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම.
5 එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.
6 ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම.
7 දර ගබඩාවක් පැවැත්වීම.
8 කළු ගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්.
9 සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
10 අයිස්ක්‍රීම් නිෂ්පාදනය.
11 පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
12 ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13 කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
14 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
15 ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
16 යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
17 යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම.
18 හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබාගැනීම.

*දෙවැනි උපලේඛනය (සම්බන්ධිතයි)*

19 පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම.
20 පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබාගැනීම.
21 විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
22 ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම.
23 පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
24 ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම.
25 දැව ගබඩා කිරීම.

*තෙවැනි උපලේඛනය*

*පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර*

1 රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
2 ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම.
3 රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම.
4 විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
5 හුණුගල් හෝ හිරිගල් පිලිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම.
6 බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
7 මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
8 වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
9 බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
10 ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
11 ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම.
12 වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම.
13 ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
14 කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබාගැනීම.
15 වැල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම.
16 ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම.
17 පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජතෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.
18 කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම.
19 වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
20 විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.
21 කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම.

12 - 614/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.